දිනමිණ සිළුමිණ The Silumina epaper

# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## නේවාසික නිවාරණ නඩත්තු වැඩ මූලිකයා (සුදුසුකම්ලත් අපේක්ෂකයන් සඳහා) [කාන්තා/පුරුෂ]

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක/අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරයි.**

කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමනාකරණ කාර්යාලයේ නේවාසික නිවාරණ නඩත්තු වැඩ මූලික තනතුරෙහි සේවය කිරීම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුර දරන්නා බහුවිධ විෂයයන්හි දක්ෂතා ඇති, පුහුණු ශිල්පීන් හත්දෙනෙකුට වැඩි කණ්ඩායමක වැඩ මූලිකයා ලෙස කටයුතු කරන අතර සියලුම නේවාසික දේපළ වල නිවාරණ නඩත්තු වැඩසටහනේ අවශ්‍යතාවන් සපුරාලීමට වගබලාගත යුතුය. නේවාසික දේපළ වල ඇති ශීතකරණ, හීටර්, වාතාශ්‍ර සහ වායුසමීකරණ පද්ධති (HVAC), ජල නල උපාංග, විදුලි ජනන පද්ධති, විද්‍යුත් පද්ධති ආදිය සවිකිරීම, ක්‍රියාත්මක කරවීම, අලුත්වැඩියාව සහ නඩත්තුවට අවශ්‍ය කාර්යයන් ඉටුකිරීම සහ මෙහෙයවීම සිදු කළයුතු වේ. එමෙන්ම පහසුකම් ඉංජිනේරුවරයාගේ සම්බන්ධීකරණය යටතේ පහසුකම් කළමනාකරණ පරිශ්‍රයට අයත් සියලුම දේපළ සහ බාරව ඇති කර්මාන්ත වලට අදාළ පද්ධතිවල දෛනික, සතිපතා, මාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික නඩත්තු කටයුතු සැලසුම් කිරීම සහ වැඩසටහන්ගත කිරීම සිදුකළ යුතුය. තවද මෙම තනතුර දරන්නා නිවාරණ නඩත්තු වැඩසටහන් සැලසුම් කිරීමට, ක්‍රියාවට නැංවීමට සහ නිරීක්ෂණය කිරීමට සහාය විය යුතු අතර, සියලුම නේවාසික පහසුකම් පද්ධති වල හදිසි සහ චර්යානුගත නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීමත්, ආරක්ෂක නියාමනයන් සහ ගුණාත්මක ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමත් සිදුකළ යුතු වේ.

**පූර්ණ කාලීනව සතියකට පැය 40 ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප ඇ. ඩො 636.83 කි.**

[වේතන ඇමෙරිකානු ඩොලර් මඟින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2024 ජනවාරි 16 වනදා වන විට විනිමය අනුපාතය ඇ. ඩො. 1 = රු. 321.50 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.]

## අවශ්‍ය සුදුසුකම්:

1. **අධ්‍යාපනය** - අ.පො.ස. සාමාන්‍ය පෙළ සම්පූර්ණ කර (ගණිතය විෂය ඇතුළුව විෂයයන් 6ක් සමත්ව තිබිය යුතු අතර, ඉන් අවම විෂයයන් 3ක් සඳහා විශිෂ්ට හෝ සම්මාන සමාර්ථ ලබා තිබිය යුතුය) තිබිය යුතු අතර, විදුලි, කාර්මික, යාන්ත්‍රික, සිවිල්, ගොඩනැගිලි සේවා හෝ වායු සමීකරණ අංශයෙන් පුහුණු ශිල්පී මට්ටමේ වෘත්තීය පුහුණුවක් හෝ ආධුනිකත්ව වැඩසටහනක් සම්පූර්ණ කර තිබිය යුතුය. **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.)**

2. **පූර්ව රැකියා පළපුරුද්ද** - විදුලි / යාන්ත්‍රික / වායු සමීකරණ / ගොඩනැගිලි සේවා හෝ විදුලි ජනක සම්බන්ධයෙන් වසර තුනක සේවා පළපුරුද්ද අවශ්‍ය වේ. එම සේවා කාලය තුල වගකීම් ක්‍රමානුකූලව වැඩිවන ආකාරයේ පළපුරුද්ද මෙන්ම සංකීර්ණ උපකරණ, උපාංග සහ පද්ධති අලුත්වැඩියා කිරීම, සේවාව සහ නඩත්තුව පිළිබඳ හැකියාවද තිබිය යුතුය. තවද, අමතර වසරක කාලයක් අධීක්ෂක තනතුරක සේවය කර තිබිය යුතු ය. **(අදාළ සේවා ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.)**

3. **භාෂා ප්‍රවීණතාවය** - III වන මට්ටමේ ඉංග්‍රීසි භාෂාව (මනා කාර්යස්ථ දැනුම) කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. **(මෙය පරීක්ෂා කරනු ලැබේ.)**
   III වන මට්ටමේ සිංහල සහ/හෝ දෙමළ භාෂාව (මනා කාර්යස්ථ දැනුම) කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4. **සේවා දැනුම** - වායු සමීකරණ, විදුලි, ජල නල, විදුලි ජනක, සිවිල් ඉංජිනේරු හෝ ගොඩනැගිලි සේවා වැනි ප්‍රධාන නඩත්තු අංශයක පුහුණු ශිල්පී මට්ටමේ දැනුම සහ හැකියාව තිබිය යුතු අතර නඩත්තු කළමනාකරණය පිළිබඳ මනා කාර්යස්ථ දැනුමක් තිබිය යුතු වේ. ගොඩනැගිලි සේවා සහ පහසුකම් කළමනාකරණය පිළිබඳ කර්මාන්ත ප්‍රමිතීන්, වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ප්‍රමිතීන් සහ භාවිතයන්, නවීන විදුලි ආම්පන්න සහ දෝෂ හඳුනාගැනීමේ උපකරණ, පුද්ගලික ආරක්ෂණ උපකරණ, බලශක්ති ඉතිරිය කිරීමේ, ප්‍රශස්ත කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ශිල්පක්‍රම පිළිබඳ පුළුල් දැනුමක් තිබිය යුතුය.

5. **නිපුණතා සහ හැකියාවන්** - සැලසුම්, විදුලි, පද්ධති, පරිපථ රූපසටහන්ද, විවිධ උපකරණ වල කාලසටහන්, මෙහෙයුම් සහ නඩත්තු අත්පොත්ද, විවිධ ඉදිකිරීම් ලියකියවිලිද කියවා තේරුම් ගැනීමේ හැකියාව තිබිය යුතුය. එමෙන්ම, පහත සඳහන් අංශවල කුසලතාවයන් සහ හැකියාවන් තිබිය යුතුය; යාන්ත්‍රික සහ විදුලි උපාංග පරීක්ෂා කිරීම, විවිධ මිනුම් උපකරණ කියවා මිනුම් සටහන් කරගැනීම, දෝෂ මූල හඳුනාගැනීම සහ අවශ්‍ය අලුත්වැඩියා කටයුතු කිරීම, අත් ආයුධ, විදුලි උපකරණ සහ විශේෂිත උපකරණ භාවිතය, නේවාසික ගොඩනැගිලි වල වායු සමීකරණ, විදුලිය බෙදාහැරීම්, විදුලි ජනක, ජල නල පද්ධති ආදිය සවිකිරීම, දෝෂ පිළිසකර කිරීම, අලුත්වැඩියාවට අවශ්‍ය කරන කර්මාන්ත සම්මත උපකරණ භාවිතය. කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා කුඩා අවකාශ වල මෙන්ම ඉතා ඉහළ උසකට දිවෙන ඉණිමං වල වැඩ කිරීම, ඉතා ඉහළ හෝ ඉතා පහළ උෂ්ණත්ව තත්ව වලදී එළිමහනේ සහ ඇතුලත කාර්යයන් කිරීම වැනි අයහපත් තත්වයන් යටතේදී පවා සේවය කිරීමට හැකියාව තිබිය යුතුය. MS Office පැකේජයේ ඇති මෘදුකාංග භාවිතය ඇතුලුව පරිගණක භාවිතය පිළිබඳ දැනුමක් තිබිය යුතුය. B පංතියේ ද්වි-කාර්යය වාහන පැදවීම සඳහා වලංගු, කල් ඉකුත් නොවූ රිය ධාවන බලපත්‍රයක් තිබිය යුතුය.

## අවශ්‍ය ලේඛන:

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතුය**. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)
- රිය ධාවන බලපත්‍රයේ පිටපත (ද්විත්ව පැති)

## අයදුම් කරන ආකාරය:

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**තැපැල් හෝ ඊමේල් මඟින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත **2024 පෙබරවාරි 08** වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.